සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/15/Sw2-01
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2023.03.07

සියළුම ප්‍රජාමූල විධායක කමිටු / බැංකු පාලක මණ්ඩල සභාපතිවරුන්

සමෘද්ධි බැංකු හා බැංකු සමිති කළමණාකරුවන් වෙත

<u>සමෘද්ධි බැංකු හා බැංකු සමිති සඳහා ක්‍රියාත්මක වන පරිගණක මෘදුකාංග පද්ධතිය සඳහා සර්වර් පහසුකම් සැපයීම වෙනුවෙන් සර්වස් ගාස්තු ගෙන්වා ගැනීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්ගේ DSD/HO/05/MF/01/චක්‍රලේඛ හා 2023/12/22 හා 2023.01/17 දිනැති ලිපිහා බැඳේ.

සමෘද්ධි බැංකු හා බැංකු සමිතිවල පරිගණක මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කිරිම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙන් සර්වර් පහසුකම් ලබා ගෙන ඇත. එම පහසුකම් සියළුම සමෘද්ධි බැංකු හා බැංකු සමිති වෙනුවෙන් එකී පහසුකම් ලබා ගෙන ඇති අතර ඊට අදාල මාසික සර්වර් ගාස්තුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙනුවෙන් අධ්‍යක්ෂ ජනරාල් විසින් ගෙවීමට ගිවිසුම්ගත වි එකගතාවය ප්‍රකාශ කර ඇති බැවින් සියළුම බැංකු හා බැංකු සමිති සෑම මාසයකම උක්ත ලිපිය මගින් දන්වා ඇති මුදල ගෙවීමට බැදී සිටින බව අවධාරණය කරමි.

ඒ අනුව මාසික සේවා ගාස්තුව ප්‍රමාදයකින් තොරව ශ්‍රී ලංකා ටෙලිකොම් සර්විස් ආයතනයට ගෙවීමට 2022 හා 2023 වර්ෂයේ එකවර මුදල් එවන ලෙස දන්වා ඇතැත් ඇතැම් බැංකු හා බැංකු සමිති මෙතෙක් අදාල මුදල් ක්ෂුද්‍ර මූල්‍ය අංශයට එවා නොමැති බව තහවුරු වි ඇත. එම නිසා සමෘද්ධි බැංකු හා බැංකු සමිතිවල පරිගණක මෘදුකාංග පද්ධතියට අදාල සර්වර් පහසුකම් අඛණ්ඩව ලබා ගැනීමට නොහැකි වී ඇති අතර එම නිසා බැංකු මෘදුකාංග පද්ධතිය නිසි පරිදි පවත්වා ගෙන යෑමට බාධාවක් වි ඇති බවත් බැංකු පද්ධතිය අවදානමකට ලක්ව ඇති බවත් අවධාරණය කරමි.

එබැවින් මේ සමග අමුණා ඇති ලේඛණයේ නම් සඳහන් සමෘද්ධි බැංකු හා බැංකු සමිති 2022 වර්ෂයට ගෙවිය යුතු රු. 46502.40 ක මුදල 2023.03.20 දිනට පෙර ඉහත ලිපියේ උපදෙස් පරිදි චෙක්පතක් ලියා අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය වෙත එවිමට කටයුතු කරන ලෙස දන්වමි.

එසේම 2023 වර්ෂයට අදාල සර්වර් ගාස්තුව ද 2023 ජනවාරි 31 දිනට පෙර එවන ලෙස දන්වා ඇතැත් එම ගාස්තුව ද එවීම බැංකු හා බැංකු සමිති මේ වන විට ප්‍රමාද කර ඇත. 2023 වර්ෂයට අදාල සර්වර් ගාස්තු මෙතෙක් එවා නැති බැංකු හා සමිති රු.59300.00 ක මුදල මාර්තු 20 දිනට පෙර එවිමට පියවර ගන්නා ලෙස දන්වන අතර අදාල ගාස්තු නියමිත පරිදි නොගෙවන බැංකු හා බැංකු සමිති සම්බන්ධයෙන් ඉදිරියේදි සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බව වැඩිදුරටත් දන්වමි.

එස්.ඒ.එස්. වික්‍රමසිංහ

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය )රා.ඉ.

පිටපත් 1. අධ්‍යක්ෂ මහාසංගම් - කරු.සමෘද්ධි බැංකු සමිති සර්වර් ගාස්තු ගෙන්වා ගැනිමට මැදිහත්වීම සඳහා

2. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ - කරු. අවශ්‍ය මැදිහත්වීම් සිදුකිරිම සඳහා

3 . නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ - කරු. අවශ්‍ය මැදිහත්වීම් සිදුකිරිම සඳහා

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 / 011-2873996 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |